Discovery Series®

# ව්‍යසනයට පසු

ව්‍යසනය හමුවේ කිතුනුවන් ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය
පිළිබඳ බයිබලීය විවරණය



අජිත් ප්‍රනාන්දු

# පටුන


ව්‍යසනයට පසු ......................2

වැළපීමට කාලයක් ...............3

හේතු විග්‍රහ කිරීමට කාලයක් .................................6

ක්‍රියාත්මක වීමට කාලයක් ................................14

යාච්ඤා කිරීමට කාලයක් ...............................20

පරිත්‍යාගශීලී වීමට කාලයක් ...............................23

සැළසුම් කරන්ට කාලයක් ...............................25

සුපරීක්ෂාකාරී වීමට කාලයක් ...............................27

සනසනු ලබන්නට කාලයක් සහ සැනසීමේ දෙවිඳුන් හට කාලයක් .......32


# ව්‍යසනයට පසු

ව්‍යසනයන් හමුවේ කිතුණුවන් ප්‍රතිචාර දැක්විය යුතු ආකාරය පිළිබඳ බයිබලීය විවරණය.

**ආචාර්ය අජිත් ප්‍රනාන්දු විසිනි.**

මෙම පොත් පිංචයේ කර්තෘ වන අජිත් ප්‍රනාන්දු ජාත්‍යාන්තර පිළිගැනීමක් ඇති ගුරුවරයෙකු හා කර්තෘවරයෙකු වේ. ශ්‍රී ලංකා යෞවන කිතුමග සංවිධානයේ ජාතික අධ්‍යක්ෂක ලෙස සේවය කරන ඔහු, ශ්‍රී ලංකාවේ අපගේ දිනපතා භෝජනය සේවයේ දේශීය අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි.

අජිත් මාගේ පුද්ගලික මිතුරෙකු වන අතර ස්වාමීන්වහන්සේගේ සේවයේ හවුල් සේවකයෙක් ලෙසද, හඳුන්වන්නට කැමැත්තෙමි. ඔහු දෙවිය-


*After The Disaster* - (Sinhala Language)
Cover Design: Naw Day Day
පරිවර්තනය : ඩෙන්වර් ප්‍රනාන්දුපුල්ලේ ස්කරණයඃ හිලරි එස්. ප්‍රනාන්දු
උපුටා ගත් බයිබල් පාඨඃ ශුද්ධ බයිබලය පැරණි අනුවාදය පළමු සංශෝධනය, ප්‍රකාශනය බයිබල් සමාගම ඩී 1990 මුද්‍රණය.


©2017 Our Daily Bread Ministries. All rights reserved.


Printed in Sri Lanka

න්වහන්සේටද, පවුලේ අයටද ඔහු සමග සේවය කරන සහෝදර සේවක-යන්ටද ඔහුගෙන් සේවය ලබන්නාවූ අයටද දක්වන ප්‍රේමය කාහටත් පැහැදිළිය. 2004 දෙසැම්බර් මස 26 වන දින රටට කඩා වැදුනු ව්‍යසනයට ශ්‍රී ලාංකික පුරවැසියෙකු ලෙස ඔහුගේ ප්‍රතිචාරය මෙසේ ගොනු කර ඇත. - ඇල්බට් ලී ජාත්‍යන්තර සේවාවන් අධ්‍යක්ෂක

## ව්‍යසනයට පසුව

මා මේ පොත් පිංච ලිවීමට වූයේ මනුෂ්‍යයන් 40,000 ක් පමණ මරණයට පත්කර ලක්ෂ ගණනින් යුත් ජනයා අවතැන් කරමින් රටට කඩා වැදුනු උදම් රැළි ව්‍යසනයට දින කිහිපයකට පසුවය. මෙම ඛේදවාචකය සිදුවූ දිනට සතියකට පසු මා විසින් ලියමින් සිටි පොතක් සම්පූර්ණ කිරීම සඳහා තුන්මසක නිවා-ඩුවකට පිටත්ව යෑමට සැලසුම් කර තිබුණි. සිදුවීම පිළිබඳ අප තිගැස්සීමට පත්ව සිටි බැවින් පැහැදිලි මනසකින් තීරණ ගැනිමට නොහැකිව සිටියෙමු. කලබලය මධ්‍යයේ වුවද ගමන යන්නට මා සූදානම් වූයෙමි. දින දෙකක් පමණ ඒ සඳහා සැළසුම් කළෙමි. නමුත් වැඩිකල් යාමට පෙර සියල්ල පැහැදිලි වන්නට විය. නැවත හැරී බලන කල එම අවස්ථාවේ මා එවැනි තීරණයක් ගැනීම ගැන පුදුමයට පත්වීමි. මෙය කිතුණුවන් වශයෙන් ජාතියේ දුක් විඳීම හා හවුල් වීමට කාලයයි. මෙවැනි අවස්ථාවක රටින් පිටවී යන්නට මට නොහැකි විය.

මෙවන් අපහසු කාලයකදී ශක්තිය හා මඟ පෙන්වීම ලබන පිණිස බයිබලය වෙතට නැඹුරු වන කල එය පිළිබඳ බොහෝ දෑ අපට ඉගෙන ගත හැක. මෙම සුවිශේෂී අවස්ථාවෙහිදී

---

**මෙවන් අපහසු කාලයකදී ශක්තිය හා මඟ පෙන්වීම**

ලබන පිණිස
බයිබලය වෙතට
නැඹුරු වන කල
එය පිළිබඳ
බොහෝ දෑ
අපට ඉගෙන
ගත හැක.

මා මෙම මාතෘකාව පිළිබඳ කළ මුල් පිටපත් සංශෝධනය කරන්නට වුයේ පොදුවේ අර්බූදකාරී තත්ත්වයකට මුහුණ දෙන අයට උපකාරී වියහැකි අයුරින් මෙය ඉදිරිපත් කරන පිණිසය.

## වැලපීමට කාලයක්

බයිබලය අපට මෙසේ කියයි. "අඬන්නට කාලයක් සහ සිනාසෙන්නට කාලයක්ය; විලාප කියන්නට කාලයක් සහ නටන්නට කාලයක්ය" (දේශනාකාරයා 3:4). මෙම කාලය වැළපීමේ කාලයයි. බයිබලයේ විලාපයන් ඇතුළත්වන වැදගත් කොටස් අන්තර්ගතය. එහි දෙවිඳුන්ගේ විශ්වාසවන්ත සෙනඟ තමන් මුහුන දෙන්නාවූ අර්බූදයක් පිළිබඳ ශෝකයට පත්ව, ඔවුනට මෙවන් විපත් වන්නට දෙවිඳුන් ඉඩ දුන් හේතුව අසති. සමහර විලාපයන් දුක් වේදනාවන් වලට සෘජුව මුහුණ දුන්නාවූ අයගෙන්ය. අනෙකුත් විලාපයන් තම දේශය දුක් විඳීම ගැන ශෝකය ප්‍රකාශ කරන්නාවූ පුද්ගලයන්ගේ විලාපයන්ය. දේශය මුහුණ දෙන්නාවූ දුක සහ ශෝකය ප්‍රකාශ කිරීම සඳහා විලාප ගී නැමති සම්පූර්ණ පොතක් බයිබලයේ අඩංගු වේ. යෙරෙමියා අනාගතවක්තෘවරයා මොරගසා "අහෝ මාගේ දියණිය වන සෙනගගේ මැරුම් කෑවුන් ගැන රෑ දහවල් අඬන පිණිස මාගේ හිස වතුරද මාගේ ඇස් කඳුළු උල්පතක් වුනොත් යෙහෙකි!" (යෙරෙමියා 9:1). ඔහුගේ ගැඹුරු වේදනාව නිසා ඔහු වැළපෙන්නට විය. ඉහත ප්‍රකාශයෙන් පසු යෙරෙමියා පවසන වදන් වලින් අපට හැඟෙනුයේ ඔහුගේ හඬා වැළපීම නිසා ආත්මය සුවපත් වූ බවය.

අපගේ පවුල මේ
සමාජයේ හෝ දේශයේ
වේදනාව
සමඟ පොර බදන
අවස්ථාවේහිදී එම
ශෝකය ප්‍රකාශ
කරන්ට අවස්ථාවක්
ලැබීම තුළින්
පීඩනකාරී තත්ත්වයන්
වලින් මිදී රටට
වඩාත් ප්‍රයෝජනවත්
පුද්ගලයෙකු බවට පත්
විය හැක.

අපගේ පවුල මේ සමාජයේ හෝ දේශයේ වේදනාව සමග පොර බදින අවස්ථාවේහිදී එම ශෝකය ප්‍රකාශ කරන්ට අවස්ථාවක් ලැබීම තුළින් පීඩනකාරී තත්ත්වයන් වලින් මිදී රටට වඩාත් ප්‍රයෝජනවත් පුද්ගලයෙකු බවට පත්විය හැක.

නෙහෙමියාට සිදුවූයේ මෙයයි. යෙරුසලම වැටී ඇති අන්ත අරාජිත තත්ත්වය පිළිබඳ සවන් දුන් කල ඔහු වැලපෙමින් ශෝකයට පත්ව, නිරාහාරව සිටිමින් සහ යාච්ඤා කරමින් දින ගණනක් සිටියේය. ඔහුගේ මුහුණේ ඉරියව් වලින් අධික ශෝකය රජතුමා පවා දකින තුරු එලෙසම සිටියේය. වැළපීමේ කාලය නිමවූ විගසම ඔහු ක්‍රියාත්මක වූ බැවින් ජාතික වීරවරයෙක් බවට පත්වූයේය. ඔහුගේ නායකත්වය වසර 2500 කට පසුව වුවද උතුම් නායකත්ව ආදර්ශයක් ලෙස සැලකේ.

බයිබලයේ ශෝකය ප්‍රකාශ කිරීම විවිධ ආකාරයෙන් කළ අයුරු දකින්නට ඇත. නිරාහාරව සිටීම (2 සාමුවෙල් 1:12) ගෝනි රෙදි දමා ගැනීම (උත්පත්ති 37:34) (2 සාමුවෙල් 3:37) සහ අළුමත වැතිරීම (එස්තර් 4:1-3; යෙරමියා 6:26, 25:34) තුළින් ශෝකය ප්‍රකාශ කළෝය. අපේ සංස්කෘතියට අදාල වන අයුරින් ශෝකය ප්‍රකාශ කරන්නාවූ ක්‍රම අප සොයා ගත යුතුය.

**අපේ සංස්කෘතියට අදාල වන අයුරින් ශෝකය ප්‍රකාශ කරන්නාවූ ක්‍රම අප සොයා ගත යුතුය.**

සැබවින්ම බේදවාචකයන් ඇතිවන කළ තමන්නේ පවුල, සභාව, ප්‍රජාව හෝ දේශය උදෙසා නිරාහාරව සිටිමින් යාච්ඤා කිරීම යහපත්ය. ශ්‍රී ලංකාවේ ශෝකය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් ලෙස සුදු කොඩි එසවීම සිදු කරනු ලැබේ. සෑම සංස්කෘතියකම එයටම ආවේනිකවූ ශෝකය ප්‍රකාශ කිරීමේ ක්‍රම තිබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රොතෙස්තන්ත ක්‍රිස්තියානි ධර්මය මුලින්ම පැමිණියේ බටහිර යුරෝපා මිෂනාරිවරුන් තුළිනි. ඉතිහාසයට අනුව මෙම මිෂනාරිවරුන් තමුන්ගේ හැඟීම් ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේ නැත. මේ නිසා වර්තමාන ශ්‍රී ලාංකික ප්‍රොතෙස්තන්ත සභාවේ වුවද බාහිරව ශෝකය ප්‍රකාශ කිරීමේ සංස්කෘතියක් නොපවතී. නමුත් පෘතුගාලයෙන් පැමිණුනු මිෂනාරිවරුන් ගෙන ආ රෝමානු කතෝලික ධර්මය අදහන ශ්‍රී ලාංකිකයන් අතර ඇත්තේ වෙනත් පසුබිමකි. ඔවුන්ගේ අවමගුල් උත්සව බයිබලයේ සඳහන් දොර්කස් මිය යාමට සම්බන්ධව තිබූ වාතාවරණය හා සමානය. "එවිට පේත්‍රුස් නැගිට ඔවුන් සමග ගියේය. ඔහු ආ කල ඔව්හූ උඩුමහලට ඔහු කැඳවාගෙන ගියෝය. සියලු වැන්දඹුවෝ ඔහු ළඟ සිට හඬ හඬා, දොර්කස් තමන් ළඟ සිටියදී මසන ඇඳුම් සහ වස්ත්‍ර පෙන්නුවෝය" (ක්‍රියා 9:39). කිතුණුවන් ශෝකවීම සහ විලාපය පිළිබඳව බයිබලීය අදහස් අපගේ සංස්කෘතියට අදාලවන ආකාරයෙන් ඇතුලු කරගත යුතු ක්‍රම පිළිබඳවද වැඩි අවධානයක් යොමු කිරීමට අවශ්‍යව ඇත.

# හේතු විග්‍රහ කිරීමට කාලයක්

## දෙවිඳුන්ගේ සර්වබාලධාරීත්වය සමඟ පොර බැදීම.

විනාශකාරී දෙයක් සිදුවීමට හේතුව පිළිබඳව ප්‍රශ්න කිරීම බයිබලීය විලාපයක එක් පැතිකඩකි. ඇදහිල්ලේ යෝධයන් වන යෙරමියා, යෝබ් සහ ගීතාවලියේ කර්තෘවරුන් මුහුණ දුන් ආකාරයට මෙම ප්‍රශ්නය හා පොර බදින ලෙසට බයිබලය අපව යොමු කරයි. තමා අවට සිදුවන්නාවූ අර්බුදය තේරුම් ගන්නට යෝබ්ට දිගුකලක් පොර බදින්ට සිදු විය. සාමාන්‍යයෙන් මෙවැනි පොර බැදීමක් අවසානයේදී දෙවිඳුන්ගේ සර්වබලධාරී බවත්,

---

> බේදවාචකයන් මධ්‍යයේ දෙවියන්වහන්සේගේ සර්වබලධාරිත්වය මත විශ්වාස කිරීම නිසා අපට පොරබැදීම මධ්‍යයේ වුවත් අපේක්ෂා භංගත්වයෙන් මිදෙන්නට හැකියාවක් ඇත.

---

උන්වහන්සේ සිදුවන්නාවූ සියළු දේ දන්නා බවත් ස්ථිර වන අතර, උන්වහන්සේ විශ්වාස කරමින් එතුමන් මත යැපෙන්නට තීරණය කිරීම යහපත්ය යන විශ්වාසය තහවුරු වේ. මෙය ගීතාවලියේ නිතර දකින්නට ඇත. (උදාඃ ගීතාවලිය 73). බේදවාචකයන් මධයේ වුවද දෙවිඳුන්ගේ සර්වබලධාරීත්වය මත විශ්වාස කිරීම නිසා, පොර බැදීම මධ්‍යයේ වුවත් අපේක්ෂා භංගත්වය ඇති වන්නේ නැත. විනාශකාරී බේදවාචකයන් තුළින් වුවද අප දෙවිඳුන්ගේ පොරොන්දුව මත යැපෙන්නට අවශ්‍ය වේ. දෙවියන්වහන්සේට ප්‍රේම කරන අයට එතුමා යම් යහපත් දෙයක් හෝ

සපයනු ඇත (රෝම 8:28)

දෙවියන්වහන්සේ පිළිබඳ මෙම ආකල්පය ක්ෂණිකව අප තුළ ඇති නොවන අතර, සමහර විට මේ පිළිබඳ දෙවියන්වහන්සේ අභිමුඛයේ පොරබදන්නට අවශ්‍යවනු ඇත. යාච්ඤාව හා උන්වහන්සේගේ වචනය මත මෙනෙහි කිරීම මේ සම්බන්ධයෙන් අතිශයින්ම උපකාරී වනු ඇත (ගීතාවලිය 27). ඔබ ව්‍යසනයට මුහුණ දී නැවත තම දෙපයින් නැගිටීමට වෙහෙස ගන්නා කෙනෙක් විය හැක. නැතහොත් ව්‍යසනයට ගොදුරු වූවන්ට උපස්ථාන කරමින් සිටි කෙනෙකු විය හැක. එසේ වුවත් ඔබ දෙවිඳුන් සහ එතුමන්ගේ වචනය සමග කාලය ගත කරන්නට අවස්ථාව සොයාගත යුතුය. මේ නිසා වාතාවරණය කොතෙකුත් භයානක වූවත් කිතුණුවන් කණ්ඩායමක් ලෙස එක්රැස්ව නමස්කාර කිරීම වැදගත්ය. අප එකමුතුව නමස්කාර කරන විට, දෙවිඳුන්ගේ ස්ර්වබලධාරීත්වය අපට සිහිපත් කරවන සදාකාලීන සත්‍යතාවයන් මත අපගේ සිත් යොමු කරන්නට හැකිවනු ඇත. මෙම සත්‍යතාවයනට අපගේ ජීවිත විවෘත වන විට අප අවට තිබෙන්නාවූ අඳුර පහව යන අතර, දෙවිඳුන් හට අප ආරක්ෂා කළ හැකි බව විශ්වාස කිරීමට ශක්තිය ලැබෙනු ඇත. දෙවිඳුන්ගේ සහ දේව වචනයෙන් සැනසීම ලැබූ අප දුක් විඳින අයට පරත්‍යාගශීලීව සේවය කරන පිණිස වඩා ශක්තිමත් වේ.

## මැවිල්ලේ කෙඳිරීම සමග එක්වීම

ආදම් සහ ඒව දෙවියන්වහන්සේට විරුද්ධව පව් කළ විට පාපය ලොවට ඇතුල්වීම නිසා භූමියේ සමබරතාවය බිඳී ගිය බව අප මතකයේ තබා ගත යුතුය. බයිබලයට අනුව මුළු මැවිල්ල ශාපයට අසුවී ඇත (උත්පත්ති 3:17, රෝම 8:20). එබැවින් දෙවියන්වහන්සේ අලුත් අහසක් සහ අලුත් පොළොවක් (2 පේතෘස් 3:18, එළිදරව් 21:1) නැවත ඇති කරන තෙක්

ස්වභාවික ව්‍යසනවලට අපට මුහුණ දෙන්නට සිදුවන බව නිසැකය. පාවුල් මෙසේ ප්‍රකාශ කළේය. "මක්නිසාද මුළු මැවිල්ල මේ දක්වා එක්ව කෙඳිරිගාමින් ගාවිනා විඳින බව දනිමුව" (රෝම 8:22). තවදුරටත් ප්‍රකාශ කරමින්, ක්‍රිස්තුස්වහන්සේ හඳුනන අයද, පංගුකාරයන් විය යුතු බව සඳහන් කළේය (23 වන පදය). මෑතකදී සිදුවූ ව්‍යසනයන් වලදී මැවිල්ල සමග දේව ජනතාවද කෙඳිරිගාන අන්දම අපි දුටිමු.

---

**වේදනාව අභ්‍යන්තරයේ සිරනොකොට දෙවිඳුන් අභිමුඛයේ සහ එතුමාගේ ජනතාව ඉදිරියේ වේදනාවෙන් කෙඳිරීමට අප ඉගෙන ගත යුතුය.**

---

කිතුණුවන් වේදනාවෙන් කෙඳිරීමට ඉගෙන ගත යුතුයි. එසේ නොවේ නම් කරදර අප වෙත එනකල දෙවිඳුන් අපව කැඳවා ඇති ස්ථානයෙන් පලා ගොස් වඩා සුරක්ෂිත ස්ථානයකට පලා යන්නට පෙළඹෙන්නට ඉඩ ඇත. අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දීම සඳහා වේදනා-වෙන් කෙඳිරීම උපකාරී වනු ඇත. රෝම 8 හි සඳහන් වන කෙඳිරීම ප්‍රසූත වේදනාව සේ දක්වා ඇත. දරු ප්‍රසූතියේදී කාන්තාවක් විඳින්නාවූ අධික වේදනාවට ඔවුන්ට මුහුණ දිය හැකි වන්නේ දරුවෙකු බිහිකිරීමේ ප්‍රීතිමත් මොහොත වෙත ඔවුන් තුළ ඇති අධික බලාපොරොත්තුව නිසාය.

මේ හා සමානව අපගේ වේදනාකාරී කෙඳිරීම් ඉදිරියේ ස්ථිර ලෙස අපට උරුම මහිමාන්විත අවසා-නය අපට සිහිපත් කරයි (2 කොරින්ති 5:2-4 බලන්න). දෙවිඳුන් අපට මුහුණ දීමට සලසන අර්බුදකාරී අවස්ථාවන් වලින් පලා නොයන්නට මෙය උපකාරී වේ. දුක් වේදනාවලට

මුහුණ දීමට අපට හැකිවන්නේ ස්වර්ගයේ වූ ස්ථිර වූ සදාකාලික මිදීම නිසැකවම අපට ලබෙන බැවිනි. වේදනාවන් පිළිබඳව ඇති තිත්තකමින් මිදෙන්නට අපට උපකාරීවේ. වේදනාව ඇතුලාන්තයේ සිර නොකොට දෙවිඳුන් අභිමුඛයේ සහ එතුමාගේ ජනතාව ඉදිරියේ කෙඳිරීමට අප ඉගෙන යත යුතුය. මෙලෙස අප ක්‍රියාකරන විට අපගේ වේදනාව ප්‍රකාශකර මුහුණ දුන්නාවූ වේදනාව නිසා අභ්‍යන්තරයේ ගොඩනැගුණු පීඩනය නිදහස් කරන්නට අවස්ථාව ලැබේ. මේ නිසා තිත්තකම වැඩිමට ඉඩක් නොලැබේ. එමෙන්ම මේ හේතුවෙන් සෘජුවම හෝ මිතුරන් තුළින් අපට සහනය දිමට දෙවිඳුන්ට ප්‍රස්ථාව ලැබෙනු ඇත. අප සැබවින්ම සනසනු ලැබූ කල තිත්තකම රජ කරන්නට නොහැක. මන්ද තිත්තකමේ මූලය වන තරහව පලවා හරින ප්‍රේමයක් අත්දැකීමට අපට හැකිවී ඇති හෙයිනි. අපගේ දේශය ජාතියක් ලෙස ව්‍යසනය නිසා කෙඳිරි ගාන අතර අප පෞද්ගලිකවද කෙඳිරි ගාන්නෙමු. සියල්ලෙහි පාලනය දෙවියන්වහන්සේගේ හස්තය මත තිබෙන බව හද පත්ළෙන්ම දන්නාමුත්, ව්‍යසනයට ඉඩදීම පිළිබඳ දෙවිඳුන්ගෙන් ප්‍රශ්න කිරීම කෙඳිරීමේ තවත් මගකි.

## වේදනාවෙන් කෙඳිරිගාන දෙවියන්වහන්සේ

බයිබලයේ ඉගැන්වීම් අතුරින් දෙවිඳුන් පිළිබඳ පුදුමාකාර ඉගැන්වීමක් රෝම 8:26 හි දක්වා තිබේ. එනම් අපගේ කෙඳිරිගෑම් අනුව එතුමාද කෙඳිරිගාන සේක. අපගේ වේදනාව කොපෙනෙන තරම් දුරින් දෙවිඳුන් සිටිනවා නොවේ. බයිබලය අපට උගන්වන ආකාරයට ඊශ්‍රායලය පීඩා විඳින කල දෙවිඳුන්ද දුක්වන සේක (යෙසායා 63:9). ඇත්ත වශයෙන්ම උන්වහන්සේ පිළිනොග න්නා අය සමගත් දුකේදී

උන්වහන්සේ සිටින සේක (යෙසායා 48:11). මෙය දෙවිඳුන් දුරස්ව සිටින බවත් අප ජීවිත හා හවුල් නොවන බවත් දෙවිඳාණන් මනුෂ්‍යයන්ගෙන් උවමනාවන්ගෙන් ඈත්ව සිටිනු යන්න සාමාන්‍ය ආකල්පයන්වලට වඩා වෙනස් එකකි. දේව කෙඳිරිගෑම අප විශ්මයට පත් නොකළ යුතුය. මන්ද යේසුස්වහන්සේ (දෙවිඳුන්) මෙලොව ජීවත් වූ කල මේ ලෝකයේ වේදනාවන් පිළිබඳවද දුක් විය. උන්වහන්සේ යෙරුසලම පිළිබඳ වැළපෙන්නට වූයේ එම නුවර වාසීන්ගේ සිත් දැඩිකමත්, ඉදිරි කාලයේදී මුහුණ දෙන්නට යන දඬුවමත් දැන ගෙන සිටි බැවිනි (ලූක් 19:41-42). උන්වහන්සේගේ මිතුරාවන ලාසරුස්ගේ සොහොන අභියසද වේදනාවෙන් වැළපෙමින් සිටි අන් අය සමග වැලපුණේය (යොහාන් 11:33-35). මේ නිසා දෙවිඳුන් හඬා වැළපෙන ශ්‍රී ලාංකික ජනතාව සමග වැළපෙන බව නිගමනය කළ හැක. දෙවියන්වහන්සේද වැළපෙන බැවින් වැළපීමෙන් වැළකෙන්නට අපට උවමනා නැත. නමුත් වඩා වැදගත් කරුණක් වන්නේ සිදුවූ විනාශය පිළිබඳව උන්වහන්සේ වේදනාවෙන් කෙඳිරිගාමින් සිටින බැවින් මෙවන් විනාශයකට ඉඩදීම පිළිබඳව උන්වහන්සේට එරෙහිව කෝප වන්නට අපට අපහසු වෙයි.

---

**මෙවැනි විනාශයකට ඉඩදීම පිළිබඳව උන්වහන්සේට එරෙහිව කෝපවන්නට අපට අපහසු වෙයි.**

---

අප ව්‍යාකූල තත්ත්වයකට පත්වූ කල සැනසීම ලබන පිණිස උන්වහන්සේ වෙතට යෑම සඳහා එතුමන්ගේ මෙම වේදනාව දැරීමේ ස්වභාවය අප ධෛර්යමත් කරයි.

## මෙය විනිශ්චයක්ද?

අපට නැගෙන ප්‍රශ්නයක් නම් මෙම ඛේදවාචකය දෙවියන්වහන්සේගේ

විනිශ්චයද යන්නයි. සමහරුන් මෙය කිතුණු සභාවන්ට පීඩා කිරීම නිසා දෙවියන්වහන්සේ දුන් විනිශ්චයක් ලෙස ප්‍රකාශ කරති. නමුත් මෙහි නිරවද්‍යතාවය පිළිබඳ ප්‍රශ්න රාශියක් උද්ගත වෙයි. ඒ නොඇදහිලිවන්තයන් සමගම දෙවිඳුන්ට අතිශයින් ප්‍රේම කල කිතුණුවන් දහස් ගණනක්ද මිය ගිය බැවිනි.

සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ සභාවන් වල වැඩිම පැමිණීමක් වාර්තා වන්නේ නත්තල් දිනයේදීය. උදම් රැළි කඩා වැදුනේ නත්තලට පසු දිනයේ දේව මෙහෙයන් පැවැත්වෙන වේලාවේදීය. සාද සහ පෙර දිනයේ සභාවන් වල මෙහෙයන්ට හවුල් වූ නිසා දේවස්ථානයට පැමිණීම ඉතා අල්ප වූයේය. දේවස්ථානයට පැමිණීම නිසා හෝ දේවස්ථානයේ පිහිටීම නිසා, දිවි ගළවාගත් අය පිළිබඳව මට දැන ගන්නට ලැබුණි. එලෙසම සමහර නිවෙස්වල රැඳි සිටි අයද මිය ගියෝය. එමෙන්ම එක් දේවස්ථානයක තිදෙනෙක් හැර අන් සියල්ලෝම මිය ගිය බව දැන ගනනට ලැබුණි. නමුත් මේ අවස්ථාවෙහිදී නිවසේ රැඳී සිටි පිරිමි පක්ෂය ජීවිත බේරා ගත්තෝය.

යේසුස්වහන්සේ මෙලොවට පැමිණිකල සෑම දෙනා මුහුණ දුන්නාවූ දුක් විඳීම උන්වහන්සේ අත්දැක්කේය. මනුෂ්‍ය වර්ගයා සමග අනන්‍යතාවයකට පත්වීම සඳහා මෙය වැදගත් වූයේය. එලෙසම යේසුතුමා අනුගමනය කරන අයද ඔවුන් අනන්‍යතාවයකට පා තබන්නාවූ අය සමග දුක් විඳීම අවශ්‍යවනු ඇත. ව්‍යසනයෙන් පසුව අප සෑම කළ යුතුව ඇත්තේද මෙයමයි. ව්‍යසනය නිසා වේදනාවට පත්වූ අය අතර කිතුණුවන් සිටීම අපගේ භාග්‍යයක් කොට සළකමු. මන්ද මේ නිසා ජනතාවගේ ශෝකය සමග අපට එක්වී සිටීමට හැකි වී ඇත. උන්වහන්සේගේ කාලයේදී සිදුවූ ව්‍යසන දෙකක් පිළිබඳව යේසුස්වහන්සේ ප්‍රකාශ කළ අදහස් අපට අතිශයින් උපකාර විය හැකිය. උන්වහන්සේ

විනිශ්චය පිලිබඳව කතා කරමින් සිටි අවස්ථාවක ගලීලවරුන් පූජා කරමින් සිටියදී පිලාත් ඔවුන් මරණයට පත්කළ සිද්ධිය සිහිපත් කරන්නට විය. සමහර විට ඔවුන් මෙම ඛේදවාචකය පිළිබඳ සිහිපත් කලේ දෙවියන්වහන්සේගේ විනිශ්චය පිළිබඳ උදාහරණයක් ලෙස විය හැක. යේසුස්වහන්සේ ඔවුන්ගේ තර්කයන් සමග එකඟ නොවී "එසේ නොවේවායි නුඹලාට කියමි. පසුතැවිලි නූණොත් නුඹලා සියල්ලෝම එසේම විනාශ වන්නෝයයි කී සේක" (ලුක් 13:13). ඉන්පසු යේසුස්වහන්සේ තවත් ඛේදවාචකයකදී විශාල කුළුණක් කඩා වැටී 18 දෙනෙක් මියගිය අයුරු සිහිපත් කල සේක.

---

**ව්‍යසනය වැනි සිදුවීම් අප හික්මවමින් අපගේ ආනාරක්ෂිතභාවය සිහිපත් කරදෙයි.**

---

ඔවුන්ද පසුතැවිලි නොවූවොත් ඔවුන්ද එසේම විනාශ වන්නෝයයි කී සේක (ලුක් 13:5). 3-5 සඳහන් සිද්ධිය පිළිබඳව අනතුරු ඇඟවීම තුළින් එහි ඇති වැදගත්කම පිළිඹිබු කරයි. යේසුස්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන දෙය නම් ඛේදවාචකයන් තුළින් අනතුරු හැඟවීම තේරුම් ගෙන පසුතැවිලිවී ඊට වඩා විනාශකාරී විපාක වලින් මිදිමය. එමෙන්ම එවැනි ව්‍යසනයන් වැනි සිදුවීම් තුළින් අපට හදිසි අනතුරු හැඟවීමක් ලැබේ. මෙවැනි සිදුවීම් අප හික්මවමින් අපගේ අනාරක්ෂිතභාවය අපට සිහිපත් කරදෙයි. අප මරණයට හා ඉන්පසු එන්නාවූ විනිශ්චයට සූදානම්ද? මෙවැනි සිදුවීම් අප ස්වභාවධර්මයා සහ අන් සියල්ලේ අධිපති වන දෙවිඳුන්ට යටහත් පහත් කමින් වැඳ වැටෙන්නට සළස්වනු ඇත. බයිබලයේ සඳහන් විනිශ්චයන් පිළිබඳ ප්‍රකාශයන් බොහෝමයක් ඇත්තේ කිතුණුවන් සඳහාමය. දේව ජනතාවට අයත් නොවන්නන්

විනිශ්චය කිරීම පිළිබඳව ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි. දෙවියන්ට එරෙහිව කැරළි ගැසීම නිසා මිනිසා විනිශ්චයට පත්වේ. ඔවුන්ට දුන් මිදීමේ මාර්ග පෙන්වා දීමට අපට හැකි සියල්ල කළ යුතුවේ. නමුත් යම් විශේෂ සිද්ධියක් දේව විනිශ්චයක් ලෙස ප්‍රකාශ කිරීම අනතුරුදායක වෙයි. අපගේ සතුරන් උදෙසා බයිබලය අපට උගන්වන අන්දමට යැදීම වඩා සුදුසුය (රෝම 12:14, මතෙව් 5:44).

එක්තරා ප්‍රදේශයක කිතුණුවන් පිරිසකට එක් ආයතනයක නායකයෙකු අධික ලෙස පීඩා කර තිබුණි. ව්‍යසනයට පසු මෙම කිතුණු කණ්ඩායම එම පුද්ගලයාගේ ආයතන භූමිය තුළ වූ සුන්බුන් ඉවත්කර උපකාර කළහ. එම ආයතනයේ නායකයා මෙම ක්‍රියාව දැක මේ කිතුණුවන් වෙත පැමිණ ඔහු අතින් සිදුවූ වරද පිළිබඳව පසුතැවිලි වී සමාව ඇයැද සිටියේය. දේව රාජ්‍යයට විරුද්ධව ක්‍රියාකල අයට විරුද්ධව දෙවිඳුන් පහර දී ඇති බව උදම් අනමින් සමහර කිතුණුවන් ක්‍රියාකළ ආකාරය මට අසන්නට ලැබුණි. මෙවන් අය පිළිබඳව දේව වචනයට අනුව මා කිය-න්නේ දෙවිඳුන්ගේ (ලූක් 13:3) දඬුවමට මුහුණ දෙන අය සමග උන්වහන්සේද දුක් විඳින බවය (යෙසායා 16:9, යෙරමියා 48:32-36, හොෂියා 11:8-9)). එම නිසා ව්‍යසනය දෙවිඳුන්ගේ දඬුවමක් වුවත් අපද පීඩා-වට පත්වූවන්ගේ ශෝකය බෙදා ගත යුතුය.

යෙරමියාගේ අනාවැකිය අනුව යුදෙව්වන් දෙවිඳුන්ට විරුද්ධව කැරළි ගැසූ බැවින් දඬුවම් ලබන්නෝය. මේ ප්‍රකාශය නිසා ඔවුන් යෙරමියාට පීඩා කළෝය. නමුත් දඬුවම දෙවිඳුන් දුන් අවස්ථාවේදී ඔහු සතුටින් " මම කිව්වානේ" යැයි ප්‍රකාශ කළේ නැත. නමුත් ඔහුගේ ජනතාව වෙනුවෙන් ඔහු ශෝක විය (යෙරමියා 9:1). ඇත්ත වශයෙන්ම විනිශ්චයට පෙරවූවත් ජනතාව පසුතැවිලි නොවූවොත් ඔවුන්ට අධික දුකක් ඇතිවනු ඇතැයි ඔහු

දැන සිටියේය. ඔහු මෙසේ කීය."නමුත් නුඹලා ඒක අසන්නේ නැත්නම්, මාගේ ආත්මය රහස් තැන්වලදී නුඹලාගේ උඩඟුකම් ගැන අඬා, බොහෝ සෙයින් කඳුළු වගුරුවනවා ඇත; ස්වාමින්වහන්සේගේ රැළද වාලට ගෙනයනු ලැබූ නිසා මාගේ ඇසවලින් කඳුළු ගලනවා ඇත" (යෙරමියා 13:17).

ව්‍යසනයේ උදම් රැළි පැමිණෙන බව විශේෂඥයින් දැනගෙන අනතුරු ඇඟවීමක් නොකළේ ඇයිද යන ප්‍රශ්නය සමහරු නගා ඇත. ඉදිරියේදී පැමිණීමට තිබෙන දෙවිඳුන්ගේ විනිශ්චය පිලිබඳව මනුෂ්‍යයන්ට අනතුර ඇඟවීමේ කාර්‍යය අප විසින් අතපසු කළ යුතු නැත.

එබැවින් අපට වේදනා ගෙන දෙන අය ආශිර්වාදයක් වන්නට නම් යෙරමියාගේ ආදර්ශය අනුව මැවුම්කරුවාණන්ගේ ඉදිරියේ පැමිණෙන්නට තිබෙන විනිශ්චයට මුහුණ දීමට හැකිවන අයුරින් ඔවුන් හා සෑම මනුෂ්‍යයෙකුම සුදානම් කළ යුතුව ඇත.

ව්‍යසනයේ උදම් රැලි පැමිණෙන බව විශේෂඥයින් දැනගෙන අනතුරු ඇඟවීමක් නොකළේ ඇයිද යන ප්‍රශ්නය සමහරු නගා ඇත. ඉදිරියේදී පැමිණීමට තිබෙන දෙවිඳුන්ගේ විනිශ් චය පිළිබඳව මනුෂ්‍යයන්ට අනතුරු ඇඟවීමේ කාර්‍යය අප විසින් අතපසු කල යුතු නැත.

## ක්‍රියාත්මක වීමට කාලයක්

සෑම ව්‍යසනයක්ම කිතුණුවන් ක්‍රියාත්මක වන පිණිස කැඳවන්නේය. දෙවිඳුන්ගේ ප්‍රේමයෙන් අප ශක්තිමත් කර ඇති

නිසාත් (2 කොරින්ති 5:14) ආත්මයාණන්වහන්සේ අපව බලවත් කරන නිසාත් (ක්‍රියා 1:8) දුක් විඳින්නාවූ ජනතාවට විශාල බලපෑමක් කිරීම සඳහා අප විශේෂයෙන් සැරසී ඇත. ව්‍යසනයක් ඇතිවුන විට කිතුණුවන් ක්ෂණයකින් ක්‍රියාත්මක විය යුතුය. තමන්ගේ ප්‍රජාවගේ අවශ්‍යතාවය පැන නැගුන මොහොතේදී මුල් කිතුණුවන් එකෙණෙහිම ක්‍රියාත්මක වෙමින් ඒ අවශ්‍යතාවයන් සපුරා දුන්හ (ක්‍රියා 4:34-37). යෙරුසලමේ ඇති වී තිබු සාගතය පිළිබඳව දැන ගන්නට ලැබූ විගසම අන්තියෝකියේ කුඩා සභාව ඔවුන්ට උපකාර කළේය (ක්‍රියා 11:28-30). මේ අන්දමට ඉතිහාසය පුරා කිතුණුවන් විවිධ සහන ක්‍රියාකාරකම්වල මූලිකත්වය ගෙන ක්‍රියාකර ඇත. වර්තමානයේ ඇති අවශ්‍යතාවයන් ඉතා උග්‍රවේ. පාවුල්තුමා 2 තිමෝති 2 පරිච්ජේයේ තිමෝතියස්ට දෙන උපදෙස් වර්තමානයේ අපට අතිශයින අදාළ වන බව කිව යුතුය. මෙම කොටස හොඳින් අධ්‍යයනය කරමින් අපගේ වර්තමාන තත්ත්වයට අදාළ කර ගනිමු.

පාවුල්තුමා කියන්නේ "ක්‍රිස්තුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙන්න" කියාය (2 තිමෝති 2:3). පාවුල් තිමෝතිගේ සේවය හැඳින්වූයේ දුක්විඳීමක් ලෙසය. පාවුල්ගේ මෙම ප්‍රකාශය පිළිබඳව අප පුදුම විය යුතු නැත. මන්ද දුක්විඳීම ඔහුගේ ජීවිතයේ සාමාන්‍ය එදිනෙදා අත්දැකීමක් විය (1 කොරින්ති 5:31, කොලොස්සි 1:24-29). මෙම කැඳවීම, දුක් විඳීම මධ්‍යයේදී ජීවත් වන සෑම කිතුණුවෙකුටම ඔවුන්ගේ දේශය උදෙසා සේවය කරමින් දුක් විඳීමට කැඳවීමකි.

තම දෙවිඳුන් සහ දේශය වෙනුවෙන් සේවය කිරීමට ඉදිරිපත් වන විට ඇදහිලිවන්ත කිතුණුවන් විවිධ ආකාර දුකට මුහුණ දිය යුතුව ඇත. උදාහරණයක් වශයෙන් සහන සේවාහි යෙදෙන පිණිස සාමාන්‍ය

තත්ත්වයකට වඩා භාර්යාව තම ස්වාමිපුරුෂයා නිදහස් කළ යුතුය. මෙය සාමාන්‍යයෙන් විවාහ ජීවිතයකට පීඩාකාරී වේ. එමෙන්ම ඇයද අමතර පීඩිත තත්ත්වයකට පත්වේ.

සහන සේවා වැඩ කටයුතු සම්බන්ධයෙන්, ලිපිලේඛන කටයුතු සම්බන්ධයෙන් සවස්වන තුරු වැඩ කරන්නට යෙදෙන තම ප්‍රේමවන්තිය සමග වැඩි කාලයක් ගත කිරිම අයෙකුට අපහසු වනු ඇත. ඔවුන් හමුවන අවස්ථාවලදී ඔහු වෙහෙසට පත්වී සිටින බැවින් නොරිස්සුම් ස්වාභාවයක් තිබිය හැකිය. නමුත් අපගේ දුක් විදීම දෙවිඳුන් උදෙසා බව තේරුම් ගැනීම වේදනාව අඩුකර ගැනීමටත් අප්‍රසාදය නැති කර ගැනීමටත් උපකාරී වේ. දුක් විඳින්නාවූ අනෙක් විධි වඩා විවෘතව දකින්නට ලැබේ. ඒවා නම් මහන්සිය, නින්ද මද කම අපගේ අරමුණ විවේචනයට ලක්වීම සහ අපගේ සේවය කරන්නාවූ ආකාරය පිළිබඳව ප්‍රශ්න ඇති වීමය. 2 තිමෝතිගේ 2 පරිච්ඡේදයේ 3 වන වගන්තියේදී පාවුල් සඳහන් කරන ආකාරයට තිමෝතියස් තමාට උරුම වේදනාවේ කොටස දරාගත යුතු අන්දම සඳහන් කරයි. "හේවාකම් කරන්නාවූ කිසිවෙක්, ඔහු හේවායෙකු මෙන් ලියාගත් අය සතුටු කරන පිණිස මේ ජීවිතේ කාරණාවලට පටලැවෙන්නේ නැත" (2 තිමෝති 2:4). මෙවැනි අවධියක මේ අයුරින් අප අපගේ ජනතාවට සේවය කිරිමට නම්, එදිනෙදා පිළිගත් අවශ්‍යතාවයන් පරිත්‍යාග කරන්නට සිදුවනු ඇත.

මෙවැනි අතිශය අර්බුද අවස්ථාවකදී, දේශයේ ජනතාවට සේවය කිරිම සඳහා අන්තවාදී වෙනස් කම් කරන්නට අපට සමහර විට සිදුවනු ඇත. අප සැමට යම් මිළයක් ගෙවන්නට සිදුවියහැකි බව අපගේ පවුල් වල අය දැනුවත් කිරීමට සිදුවනු ඇත.

---

**නමුත් අපගේ දුක් විඳීම දෙවිඳුන් උදෙසා**

සිදුකරන බව
තේරුම් ගත් විට
වේදනාව අඩුකර
ගැනීමට හා අප්‍රසාදය
ඉවත්කර ගැනීමට එය
උපකාරී වේ.

ඇත්ත වශයෙන්ම පවුල් ජීවිතය වැදගත්ය. අපගේ පවුල් ගොඩනැංවීම හා නඩත්තු කිරීම සෑම විටම මුල්තැන ගත යුතුයි. නමුත් වර්තමානයේ අප ඉදිරියේ තිබෙන්නාවූ අර්බුදය නිසා අප යම් දේ කරන ක්‍රම වෙනස් කළ යුතුව ඇත.

උදාහරණ ලෙස මාගේ විවාහ සංවත්සරය යෙදී තිබුණේ එක් ව්‍යසනයකට දින කිහිපයකට පසුවය. මාගේ දරුවන් අධිකව වෙහෙසට පත්ව සිටියහ. එසේ වුවද උදෑසන සිට රාත්‍රිය දක්වා සහන කටයුතුවල යෙදී සිටියහ. මෙතරම් ජන සංඛ්‍යාවක් ප්‍රාථමික අවශ්‍යතාවයන් පවා නැතිව සිටින විට සංවත්සර සැමරීමට වැඩි මුදලක් වැය කිරීම පිළිබඳව මාගේ භාර්යාව අකමැත්ත ප්‍රකාශ කර සිටියාය. නමුත් රාත්‍රී ආහාරයට පවුලේ සැම එක් රැස්කර ගන්නට ලැබුණි (ප.ව. 9.30ට). අපි මිළ අඩු ආපන ශාලාවකට ගියෙමු. ආහාර වේලකට අප හතර දෙනාට වැය වූයේ රු:500 ක් වැනි සුළු මුදලක්ය. පැවතුණු හදිසි අවස්ථාව නිසා මිළ අධික ආපන ශාලාවකට යෑම වැරැද්දක් බව මට හැඟුණි. නමුත් පවුලක් ලෙස සමරන්නට අවස්ථාවක් අප ලබා ගත්තෙමු. පාවුල් තුමා ප්‍රකාශ කරන පරිදි දුක් විඳීමේ තවත් පැතිකඩක් ලෙස ගොවියෙක් වෙහෙසවන ආකාරය සඳහන් කරයි (2 තිමෝති 2:6). තවත් ස්ථානයක ඔහු ප්‍රකාශ කරමින් "ඒ හැර මා තුළ බලවත් ලෙස කෙරෙන උන්වහන්සේගේ ක්‍රියා කිරීමේ ප්‍රකාරයට ඒ සඳහා මම පොර අල්ලමින් වීර්‍යය කරමි" (කොලොස්සි 1:29). මියැදෙමින් ඇති ලොවක් සමග ක්‍රිස්තුස්වහන්සේගේ පණිවුඩය බෙදා අප ජීවත්ව සිටින තුරු වැඩ කළ යුතු වේ. කවදා හෝ අප ස්වර්ගයට ගිය විට අනර්ඝ විවේකයක් ලැබෙනු ඇත

(එළිදරව් 14:13). දැන් වැඩ කරන වේලාවයි

ඉන්දියාවේ අනාථ දරුවන් අතර සේවය කළ මිෂනාරි එමිකාර් මයිකල් මෙසේ කියයි. අපට අපගේ ජය සමරන්නට මුළු ජීවිත කාලයක්ම ඇතත්, එම ජය ලබාගන්නට ඇත්තේ හිරු බසින්නට පෙරවන පැය කීපයකි. ව්‍යසනයෙන් පසු මුල් කාලයේදී ශ්‍රී ලාංකික කිතුණුවන් විශාල සංඛ්‍යා-වක් අධික වෙහෙසට පත් වුහ. මෙය වළක්වා ලිය නොහැක. මන්ද ජාතිය මුහුණ දී ඇත්තේ බලවත් ව්‍යසනයකටය. මෙම කාලය අපගේ ජනතාව වෙනුවෙන් දුක් විඳින්නට සිදුවන කාලයයි. වෙහෙස වී වැඩ කරන්නට යන කිසිවක් නොමැති අයට දෙන පිණිස අප ඇලුම් කරන සමහර දේ පරිත්‍යාග කිරීමටත් කාලයක්ය..

---

**මෙම කාලය අපගේ ජනතාව වෙනුවෙන් දුක් විඳින්නට සිදුවන කාලයයි. වෙ-හෙසවී වැඩ කරන්නට සහ කිසිවක් නොමැති අයට දෙන පිණිස අප ඇලුම් කරන සමහර දේ පරිත්‍යාග කිරිමටත් කාලයක්ය.**

---

වෙහෙස නොබලා මෙම කාලය තුළදී වැඩ නොකළ හොත් එය බරපතල වරදකි. තම දේශය අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දෙන අවධියක සැහැල්ලුවෙන් සහ විනෝදකාමීව ජීවත්වූ අයට දුක්වේ යැයි ආමොස් ප්‍රකාශ කළේය (ආමොස් 6:1-6). රජවරු යුද්ධයට යා යුතුව තිබියදී දාවිත් නිවසේ තනිවූ බැවින් පාපයට වැටුණේය (2 සාමුවෙල් 11:1). 2 තිමෝති 2 පරිච්ඡේදයේ 8-13 දක්වා පාවුල් තිමෝතියස්ට ලියමින් දෙවිඳුන්ගේ සේවයේ දුක් විඳින්නට සිදුවුවහොත් එය ආශිර්වාදයක් යැයි සඳහන් කරයි. "අපි උන්වහන්සේ සමග මැරෙමු නම් උන්වහන්සේ සමග ජීවත් වෙමු. අපි ඉවසමු නම් උන්වහන්සේ සමඟ

රජකම් කරන්නෙමු". නුමුත් මෙහි අනතුරු ඇඟවීම-ක්ද ඇත. අපි උන්වහන්සේ නාඳුනමියි කියමු නම් උන්වහන්සේත් නුඹලා නිඳුනමියි කියන සේක. අප අවිශ්වාස වුනත් උන්වහන්සේ විශ්වාසව සිටින සේක. මක්නිසාද තමන්වහන්සේගේ වචනය බොරු කරන්ට උන්වහන්සේට බැරිය. (2 තිමෝති 2ඉ-13) පද ඉදිරියේ එන්නා වූ විනිශ්චය භයංකාරවූද සැබෑවුද එකක් බව අපට සිහිපත් කරයි. සේවය සඳහා ත්‍යාගයක්ද අකීක-රුකමට දඬුවමක්ද ඇත . මෙය ක්‍රිස්තියානි ජීවිතයේ කේන්ද්‍රීය වටිනාකමකින් යුත් සත්‍යතාවයක්ය.

යම් දිනයකදී අපගේ පුද්ගලික පරිත්‍යාගශීලිකම ප්‍රයෝජනවත් වූ බව අපට දැනගන්නට ලැබෙනු ඇත.

---

යම් දිනයකදී අපගේ පුද්ගලික පරිත්‍යාගශීලිකම ප්‍රයෝජනවත් වූ බව දැනගන්නට ලැබෙනු ඇත.

---

අන්තිමයා පළමුවෙනියාද පළමුවෙනියා අන්තිමයාද වී ඇත (ලූක් 13:30). මේ නිසා අප කරන්නාවූ වැඩ සඳහා තවත් අය ගෞරවය ලබන විට කනස්සලු නොවිය යුතුය. මේ නිසා කිසි ලෞකික ගෞරවයක් නොලැබෙන්නාවූ වැඩ කරන්නටත් අප යොමුවිය යුතුව ඇත. කුඩා යැයි කිසිම වැඩක් පිළිබඳ අප නොසිතිය යුතුය. මන්ද දෙවිඳුන් සේවකයන් වන පිණිස අප ශක්තිමත් කරයි. එය අපිරිසිදු වැසිකිළි පවිත්‍රකිරිම හෝ පැසවූ තුවාල වලට බෙහෙත් දැමීම හෝ කුණු කසල ඉවත් කිරීම හෝ විය හැක. මෙවැනි කාර්යයන් කරන්නට අපට ශක්තිය ලැබෙනවා පමණක් නොව ඒවා කිරීම මහත් භාග්‍යයක් කොට සළකන්නට අපට හැකියාවක් ඇත.

ව්‍යසනයක් සිදුවූ අවස්ථාවේ සිට මිනිසුන් පහත් ලෙස සැලකූ වැඩ

කිතුණුවන් විසින් කල බව මා වාර්තා කරන්නේ අධික ප්‍රීතියෙන් යුතුවය. ඇත්ත වශයෙන්ම සමහර ස්වෙච්ඡා සේවකයින් පුදුමයට පත්වූයේ ඔවුන් කළ සමහර මේ ක්‍රියාවන් මහන්තත්තව පාමින් ඔවුන්ට කථා කළ නිසාය. සාමාන්‍යයෙන් පාපිෂ්ඨ වූ පංති භේදය අනුව පුද්ගලයා වර්ග කරන්නාවූ මිනිසුන් කථා කරන්නේ මේ ආකාරයෙන් වන බැවින් අප ස්වෙච්ඡා සේවකයන්ගේ සිත් රිදීම් ඇතිවූ අතර මා තුළ අධික කෝපයක්ද ඇති විය. නමුත් මම දෙවිඳුන්ට ප්‍රශංසා කරන්නේ ඒ මධ්‍යයේදීද ඔවුන් නොකඩවා තම කාර්‍යයේ යෙදුණු බැවිනි. අප තුළ තිබෙන ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රේමයත් දේවරාජ්‍ය-යේ කුමර කුමරියන් ලෙස අපගේ අනන්‍යතාවයත් විනිශ්චය දිනයේදී ලැබෙන්නට තිබෙන ගෞරවයත් නිසා අන් අය කරන්නට අකමැතිවූ කාර්‍යයන් කරන පිණිස සේවකයන් වීමට අපට ශක්තිය ලැබුණි. භේදවාචකයන් ක්‍රිස්තියානි සේවකත්වය සඳහාම වන කාලය වෙයි.

## යාච්ඤා කිරීමට කාලයක්

කිතුණුවෙකුට කළ හැකි බලවත්ම කාර්‍යය යාච්ඤා කිරීමය. පාවුල් තුමා කියන අන්දමට ඵලදායී මැදිහත්කාරකමේ යාච්ඤා කිරීම සඳහා අධික ශ්‍රමයකින් වැඩ කළ යුතුය (කොලොස්සි 4:12-13). පරණ ගිවිසුම කාලයේදී

---

**කිතුණුවෙකුට කළ හැකි බලවත්ම කාර්‍යය යාච්ඤා කිරීමයි.**

---

දේශය අර්බුදයකට මුහුණ දෙන විට දේව ගරුබිය ඇති නායක-යන් ජනතාව යාච්ඤාවට කැඳෙව්වෝය. බොහෝ විට නිරාහාරව සිටීමටද

කැඳෙව්වෝය. ජාතික බේදවාචකයන් මධ්‍යයේ නිරාහාරව යාච්ඤා කිරීම සිදුවිය (සාමුවෙල් 1:12). ජෙහෝසෙපත් රජතුමාට එරෙහිව මහත් සමූහයක් සටන් වදින්නට එන විට ඔහු භය විය. නුමුත් ක්ෂණික ප්‍රතිචාරය වූයේ "ස්වාමින්වහන්සේ සොයන්නන්ට සිත යොමු කර යුදා මුළුල්ලෙහි උපවාසයක් ප්‍රකාශ කිරීමය" (2 ලේකම් 20:3). මෙවන් අවස්ථාවකදී අප බලාපොරොත්තු විය හැක්කේ යුද්ධයට සුදානම් වීම සඳහා හමුදාව සුදානම් කිරීමය. ඒ වෙනුවට ඔහු ජනයා එක් රැස්කොට යාච්ඤාවට කැඳවූයේය. මෙහි ප්‍රතිඵලය ලෙස දෙවියන්වහන්සේ මැදිහත් වී ඔවුන්ට විශිෂ්ඨ ජයග්‍රහණයක් දුන්නේය. කෙතරම් අධික වැඩ කොටසක් තිබෙන මුත් සහන සේවා ක්‍රියාවලිය තුළ පුද්ගලික සහ සාමුහික යාච්ඤාව වැදගත් අංගයක් විය යුතුය. යාච්ඤාවේ ඇති අලංකාරත්වය වන්නේ ඕනෑම කෙනෙකුට එය කළ හැකි වීමය. තරුණ සහ මහළු ශාරිරිකව ක්‍රියාකාරී සහ ඔත්පල වූ අයටද හවුල් විය හැක. ජාතික හෝ ප්‍රාදේශික වශයෙන් අර්බුද පැන නගින විට කිතුණු නායකයන් තම සෙනඟ විශේෂ ආකාර යෙන් යාච්ඤා හා නිරාහා රව සිටීමට කැඳවිය යුතුය. වර්තමානයේ යාච්ඤා කළ යුතු කාරණා කිහිපයක් මෙලෙස ඉදිරිපත් කරමි.

- සෑම සෙනෙහවන්තයන් හා ඉඩකඩම් අහිමි වූ අයට දෙවියන්වහන්සේගේ අනුග්‍රහය ලැබෙන පිණිස

---

අධික වැඩ කොටසක් තිබෙන මුත් අපගේ සහන සේවා ක්‍රියාවලිය තුළ පුද්ගලිකව සහ සාමුහිකව යාච්ඤාව වැදගත් අංගයක් ලෙස ක්‍රියාත්මක කළ යුතුය.

---

- අධික චිත්තවේගී කම්පනයට පත්වූ අයට සුදුසු උපස්ථාන ලැබෙන පිණිස, අවතැන්වූ අයට තම නිවාස ප්‍රශ්නයට කඩිනම් විසඳුම් ලැබෙන පිණිසත්ය.
- කඳවුරු වල ලැගුම්ගෙන සිටින්නාවූ අයට අවශ්‍යතාවයන් ලැබෙන පිණිසත් සහ විශේෂයෙන් කාන්තාවන් හා දරුවන් වැනි අපචාරයට ලක්විය හැකි අයගේ ආරක්‍ෂාව උදෙසා.
- කිතුණුවන් පරිත්‍යාග ශීලි ලෙස ඵලදායී සේවයක් කරන පිණිස ඉදිරිපත්වන මෙන්.
- අපගේ ක්‍රියාවන් සහ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ අපගේ සාක්ෂිය තුළින් සභාව පිබිදී දෙවිඳුන්ට ගෞරවය ගෙන දෙන පිණිස.
- අප දේශය සුවපත් වන පිණිස අප එකිනෙකාගේ දායකත්වය පිළිබඳ දෙවියන්වහන්සේගේ මඟ පෙන්වීම ඉල්ලා යාච්ඤා කරන්න.
- සහන සේවය සහ පුනරුත්ථාපන කටයුතු කරන්නාවූ සංවිධාන වෙනුවෙන් (විශේෂයෙන්) කිතුණු ආයතන, සභාවන් සහ විනාශයට පත්වූ ප්‍රදේශවලට මුදල් වෙන් කරන්නාවූ රජයේ නිළධාරීන් වෙනුවෙන්.
- සහන සේවයට බාධක විය හැකි දූෂණ, නාස්තිය. සැළසුම් රහිතභාවය අවම වන පිණිස.
- දේශය සුවවීමේ ක්‍රියාවලියට හිතකර ප්‍රතිපත්ති සකස් කර ගන්නා පිණිස දේශපාලන නායකයන් වෙනුවෙන්.
- අතිවිශාල කාර්‍යයක් වන්නාවූ දේශය නැවත ගොඩ නැංවීමට අවශ්‍ය වන්නාවූ ද්‍රව්‍ය ලැබෙන පිණිස.
- මෙම ඛේදවාචකය තුළින් සමාදානය මෙම දේශයට නැවත ඇතිවන පිණිස.
- දෙවියන්වහන්සේගේ මහිමය මින් පෙර නොවූ ආකාරයෙන් බබළවන පිණිසත්,

ඒ නිසා දෙවිඳුන් සොයන්ටත්, ගැළවීම අත්දකින්ටත් මිනිසුන් නැඹුරුවන පිණිසත්.

## පරිත්‍යාගශීලී වීමට කාලයක්

අන්තියෝකීය සභාවේදී අගබස් ඉදිරියේදී පැමිණෙන්ට තිබූ සාගතයක් පිළිබඳ අනාවැකි පැවසූ විගසම යෙරුසලමට යවන පිණිස ඔවුන් දිමනාවක් එකතු කළෝය (ක්‍රියා 11:27-30). පසුව යෙරුසලමේ අවශ්‍යතාවයන් සපුරා ගන්නා පිණිස පාවුල් විසින් පලස්තීනයට පිටතින් තිබුණාවූ සභාවන් කිහිපයකින් මුදල් රැස් කර අරමුදලක් ආරම්භ කළේය (2 කොරින්ති 8:9). ක්‍රිස්තියානි ධර්මයේ දිළිඳුන්ට දීම වැදගත් අංගයකි (ද්වීතීය කථාව 15:7-11, මතෙව් 5:42, 19:21, ලූක් 12:33, ගලාති 2:10, 1 තිමෝති 6:18, හෙබ්‍රෙව් 13:16).

---

**දෙවියන්වහන්ස්ගේ සෙනඟ තමන්ගේ සම්පත් විශේෂයෙන්ම දුක් විඳින්නාවූ මනුෂ්‍යයන් සමග බෙදා ගන්නා කාලය පැමිණ ඇත.**

---

දෙවියන්වහන්සේගේ සෙනඟ තමන්ගේ සම්පත් දුක් විඳින්නාවූ මනුෂ්‍යයන් සමඟ බෙදා ගන්නට කාලය පැමිණ ඇත. පාවුල් ප්‍රකාශ කළ ආකාරයට ප්‍රධාන කොට ඇදහිල්ලේ පවුලට අයිතිවූවන්ට වගකීමක් ඉෂ්ඨ විය යුතුවේ. ගලාති 6:10 මේ නිසා අපගේ ප්‍රථම වගකීම වන්නේ ක්‍රිස්තුස්වහන්සේ තුළ අපගේ සහෝදර සහෝදරියන් වෙතටය. නමුත් අපගේ පරිත්‍යාග යන් අවශ්‍යතාවයන් ඇති අනෙකුත් අය වෙතටද යා යුතු බව කිව යුතුය. නව ගිවිසුමේ හත් වතාවක් සඳහන් වන

ගිවිසුමක් ලෙස අපගේ අසල්වැසියාට තමාට මෙන් ප්‍රේම කළ යුතු බව සඳහන් වේ (මතෙව් 19:19; මාර්ක් 10:31; ලූක් 10:27; රෝම 19:9; ගලාති 5:14; යාකොබ් 2:8).

විදේශ රටවලින් අධික මුදල් ප්‍රමාණයක් සහ භාණ්ඩ එමින් පවතී. මේ හෙයින් අපගේ පරිත්‍යාග යන් කුඩා වන බැවින් ඒවා බෙදාහැරීමේ අගයක් නැත යන වැරදි මතයක් අප තුළ තිබෙන්නට පුළුවන. නමුත් අප මතක තබා ගත යුතු කරුණක් වන්නේ ත්‍යාග යක බලය රඳා පවතින්නේ එහි ඇති මුදල් ප්‍රමාණය මත නොවන බවයි. යේසුස්වහන්සේ වැන්දඹුවගේ පරිත්‍යාගය පිළිබඳ උගන්වමින් එම මුදල ඉතා කුඩා ප්‍රමාණයක් වූවත් යේසුස්වහන්සේ ප්‍රකාශ කළේ "සැබැවක් සැබැවක් නුඹලාට කියමි. ගබඩාවේ මුදල් දමන සියල්ලන්ට වඩා මේ දිළිඳු වැන්දඹුව දැමුවාය" (මාර්ක් 12:14) කී සේක.

---

**අප මතක තබා ගත යුතු කරුණක් වන්නේ ත්‍යාගයක වටිනාකම රඳා පවතින්නේ එහි ඇති මූල්‍යමය වටිනාකම මත නොවන බවයි.**

---

කිතුණු නායකයන් විසින් තම සභාවේ සෙනඟව පරිත්‍යාගශීලි බවට යොමුකළ යුතුව ඇත. ඔවුන්ගේ දීමනාව කුඩා වූවත් දෙවිඳුන් ඒ මත ක්‍රියාකරන විට මහත් බලයක් ලැබිය හැකි බව ඉගැන්විය යුතුය. ඔව්හු පරිත්‍යාග කළ යුත්තේ කවදාද, කෙළෙසද, කොතැනද යනාදිය පැහැදිළිව ඉගැන්විය යුතුව ඇත. යෙරුසලමේ අරමුදල සඳහා කොරින්ති සභාවට පරිත්‍යාග වන පිණිස ඔවුන් ධෛර්‍යමත් කිරිමට යැවූ දෙවැනි ලිපියේ වැඩි අවධානයක් යොමුකරමින් යෙරුසලමේ අරමුදලට මුදල් එවන ලෙස ඉල්ලා සිටියේය (2 කොරින්ති 8-9)

එලෙසම දීමනාවක් යැවිය හැකි අයුරු සහ එම මුදල් වියදම් කරන ආකාරයන් පිළිබඳව විස්තරද ඔහු ඉදිරිපත් කළේය (1 කොරින්ති 16:1-4).

## සැළසුම් කරන්ට කාලයක්

පළමු කොරින්ති 16:1-4 අපට පෙන්වන්නේ දීමනා ලබාදීමත් එය වියදම් කිරීමත් ඕනෑවට එපාවට නොකළ යුතු බවය. සහන සේවයටත් පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළත් මෙම මුලධර්ම ක්‍රියාත්මක විය යුතුය. හිතෝපදේශයේ සඳහන් පරිදි නියමිත සැළසුම් සහ උපදේශ මත යුද්ධ කළ යුතුය. ඊට හේතුව වඩාත් ප්‍රඥාවන්ත සැලසුම් ක්‍රියාත්මක කළ යුතුව තිබෙන බැවිනි (හිතෝපදේහ 29:18; 24:6). වර්තමානයේ මනුෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන් සපුරා දීම නැමති "යුද්ධයට"ද මෙය අදාල වනු ඇත. සමහර විට සැළසුම් කිරීම දුර්වල නිසා අධික කාලයක් ශක්තිය සහ සම්පත් නිකරුනේ නාස්තිවනු ඇත. බොහෝ අවශ්‍යතා වලින් පෙළෙන අයට සහන නොලැබී යෑමට පුළුවන. සමහර අයට අවශ්‍ය ප්‍රමාණයට වැඩි යෙන් ලැබිය හැකිය. මේ සෑම දෙයක්ම සිදුවන්නේ සැළසුම් කිරීමේ දුර්වලතාවය නිසාය.

> අධික කාලයක් ශක්තිය සහ සම්පත් නිකරුනේ නාස්තිවනු ඇත.

හදිසි අවශ්‍යතාවයන් ලබාදීමේ සිට ජීවිත නැවත ගොඩ නැංවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන අවස්ථාවේ සිටම සැළසුම් ගතව එය ක්‍රියාකිරීම අත්‍යවශ්‍යය. කුඩා කණ්ඩායම් තුළින් මෙම කාර්යය ඉෂ්ට කිරීම ඉතා සාර්ථක වනු ඇතයි මා සිතමි. ක්‍රිස්තුස්වහන්සේ තුළ අපට ඇති ඒකියභාවය බෙදා ගන්නට විවිධවූ

සභාවන් හා පැමිණෙන්නා වුවන් හා සම්බන්ධ වී මේ කාර්‍යයේ යෙදීම ඉතා අලංකාර අත්දැකීමක් වනු ඇත.

දීමනා වලින් සපිරුනු ස්වකැමැත්තෙන් ඉදිරිපත් වන්නාවූ ශක්තිමත් පුද්ගලයන් සභාවල සිටිති. සහන සේවා සහ පුනරුත්ථාපන ක්‍රියාවලියේ යෙදෙන පිණිස පැමිණෙන විශේෂ කණ්ඩායම්වලට අවශ්‍ය ප්‍රමාණයෙන් මිනිස් ශ්‍රමය නොමැති නිසා මෙවැනි අය ඔවුන්ට මහත් උපකාරයක් වන බව නොඅනුමානය. දේශනාකාරයා 4:9 සඳහන් න්‍යාය ප්‍රායෝගිකව ක්‍රියාත්මක වන අවස්තාවක් ලෙස මෙය හැඳින්විය හැක. "එක්කෙනෙකුට වඩා දෙදෙනෙකු හොඳය. මක්නිසාද ඔවුන්ගේ වෙහෙසට ඔවුන්ට හොඳ ප්‍රතිඵල ලැබෙන්නේය". අපගෙන් වැඩි දෙනෙක් බොහෝ කාර්‍යයන් කිරීම සඳහා දැනුමත් හැකියාවත් නොමැති බැවින් අන් අය සමග හවුල් වී ක්‍රියා කිරීම ප්‍රඥාවන්ත ක්‍රියාවකි.

සභාව සමඟ සම්බන්ධතාවයක් නොමැති අනෙකුත් කණ්ඩායම් වලට උපකාර කිරීම තුළින් අප දේශය ගොඩනැංවීම සඳහා අපට ඇති කැපවීම විදහා පෑමට මෙය සුදුසුම අවස්ථාවක් ලෙස හැඳින්විය හැක. අපි ලෝකයන් දෙකක පුරවැසියන් වෙමු. මේ නිසා මේ ලෝකයන් දෙකෙහිම අපි කරන්නාවූ සියල්ලක්ම දෙවිඳුන් වෙනුවෙන් සහ එතුමාගේ මහිමය සඳහා කරන්නෙමු (කොරින්ති 10:31). අප "ලෞකික" ලෙස හඳුන්වන ආයතන වල කරන්නට යෙදෙන රැකියා දෙවිඳුන්ගේ ගෞර වය සඳහා කළ යුතු වේ. රැකියාව වැදගත් එකක් වන්නේ එතුමන්ගේ සාක්ෂිකරුවෙකු ලෙස අපව තබා ඇති සමාජයේ යහපත සඳහා සේවය කරන්නට කැඳවා තිබෙන නිසාය. සහන සේවය සහ පුනරුත්ථාපන ව්‍යාපෘතින් රජය විසින් හෝ අසල්වැසි කණ්ඩායම් තුළින් සමාජයට සේවය කරන්නට නැඹුරු-වන විට මෙම මූලධර්මය අදාළ වනු ඇත.

අපි ලෝකයන් දෙකක පුරවැසියන් වෙමු. මේ නිසා මේ ලෝකයන් දෙකෙහිම අපි කරන්නාවූ සියල්ලක්ම දෙවිඳුන් වෙනුවෙන් සහ එතුමාගේ මහිමය සඳහා කරන්නෙමු.

ක්‍රිස්තුස්වහන්සේ නියෝජනය වන පිණිස අපගේ අසල්වැසියන් හා ඒ අයගේ ව්‍යාපෘතීන් වලට හවුල් වී ක්‍රියා කිරීමට අවස්ථාවන් සොයා බැලිය යුතුය.

## සුපරීක්ෂාකාරී වීමට කාලයක්

පාවුල් තුමා 2 තිමෝති 2:5 තිමෝතියස්ට දුක් විඳින්ටත් වෙහෙසව වැඩ කරන්ටත් දිරි ගන්වයි. එමෙන්ම නීතිරීති අනුකූලව තරඟ වදින මලල ක්‍රීඩකයෙකු ලෙස ක්‍රියා කරන්නට දිරි ගන්-වයි. වේගවත්ව දිව යන අවස්ථාවේදී පය පැටලී වැටෙන්නට අවස්ථාවන් බොහෝ ඇත. සහන සේවාවන් වල යෙදී සිටින සමහර අය රකින්නට තිබුණු මේ නීතිරීති කඩා බිඳ දමන්නට යොමුවීම අවාසනාවන්ත සිදුවීමකි. මේ නිසා මෙවන් සහන සේවයන් වල යෙදී සිටින අවස්ථාවේදී ක්‍රිස්තියානි සේවයේ මූලධර්මය අනුව කිරීමට වගබලා ගත යුතුව ඇත. උදාහරණයක් වශයෙන් ඛේදවාචකය හේතු කොටගෙන අප මුහුණ දෙන සුවිශාල කර්තව්‍යය මධ්‍යයේදී දෙවියන්වහන්සේ සමග පුද්ගලික කාලයක් හෝ තම භාර්යාව සහ දරුවන් සමග කාලය ගත කිරීම හෝ අතපසුවන්ට පුළුවන. නමුත් මෙවන් අතපසුවීම් දීර්ඝ කාලයක් තුළ වීමට ඉඩ නොදිය යුතුයි. දෙවිඳුන් සමග පුද්ගලිකව ගත කරන කාලය දීර්ඝ කාලයක් අතපසු කළහොත් ආත්මිකව රෝගී

තත්ත්වයකට පත්විය හැක.

---

## දෙවිඳුන් සමග පුද්ගලිකව ගත කරන කාලය
## දීර්ඝ කාලයක් අතපසු කළහොත් අප ආත්මිකව රෝගී තත්ත්වයකට පත්විය හැක.

---

අපගේ සහකරු හෝ සහකාරිය සහ පවුලේ අනෙකුත් සාමාජිකයන් සමග කාලය ගත කිරීම දීර්ඝ කාලීනව අතපසු වුවහොත් රෝගී පවුල් ජීවිතයක් ගොඩ නැංවීමට හේතු විය හැක. නොකඩවා නිදි මරමින් විවේකයක් නොමැතිව වැඩ කරන්නට යෙදුනහොත් අපේ ශරීරයට හා අපගේ උද්වේගයට අධික ලෙස බලපානු ඇත. මේ නිසා අපට දුර්වල වී ශාරීරික හැසිරීම කැළඹීම් සහගත තත්ත්වයකට පත්වේ.

හදිසි අවස්ථාවකට මුහුණ දෙන විට ක්ෂණික කව ක්‍රියාත්මක වන්නට අවශ්‍ය වන නිසා අපට මුළු ශ්‍රමය යොදා සමහර විට විවේක නොගෙන ක්‍රියාත්මක වන්නට සිදුවනු ඇත. නමුත් මෙම කලබලය මධ්‍යයේ වුවද විවේක ගන්නටත් දෙවිඳුන් සමග කාලය ගත කරන්නටත් කාලය වෙන්කරමින් නිශ්චිත පිළිවෙලකට හුරුවෙන්නට සිදුවනු ඇත. සබත් නිවාඩුවේ මූලධර්මයට අනුකූලව සතියකට එක් දිනක් විවේක ගැනීමෙන් මෙම ක්‍රමයට ඇතුළත් විය හැක. දුප්පත්කම පිටු දැකීමේ ක්‍රියාවලියේ යෙදී සිටින සියලු දෙනාටම මෙය අදාළ වේ. උදාහරණයක් වශයෙන් ඔත්පලවී හෝ කර කියා ගන්නට බැරි තම සෙනෙහවන්තයෙකුට උපස්ථාන කරන කෙනෙක් දෙවිඳුන් සමග කාලය ගත කරන්ටද විවේක ගැනීමටද නිශ්චිත කාලයක් වෙන් කිරීමට වගබලා ගත යුතුය. නැතහොත් නොරිස්සුම් ස්වභාවයක් ඇති වී ඵලදායි ලෙස උපස්ථාන කළ නොහැකි තත්ත්වයකට පත් විය හැක. විවේක-

යක් නොගෙන නොකඩවා වැඩ කිරීම සහ ආත්මික පෝෂණය ලබා නොගැනීම නිසා අප තුළ ප්‍රීතිය නැතිවී, නොරිස්සුම් ස්වභාවය ඇති වීමත් සමහර විට කලකිරීමත් ඇතිවේ. The New Testament Image of the Ministry (Grand Rapids: Baker 1974 p.133) නැමති ග්‍රන්ථයේ ඩබ්. ටී. පර්කයිසර්, අනුශාසක සේවයේ යෙදී සිටින කෙනෙකු උපුටා දක්වමින් තමා වෙත පැමිණි කිසිම පුද්ගලයන් අතර වෙහෙස නිසා කලකිරීමට පත් නොවූ අයකු නොසිටි බව කියයි.

ආත්මයෙන් පිරුණාවූ කිතුණුවන්ගේ ප්‍රධාන ගුණාංගය ප්‍රීතිය වන නිසා (යොහාන් 6:22) එම ප්‍රීතිය ඔවුන් වෙතින් ගිලිහෙන කල කිතුණුවන් ලෙස හැසිරීම ද ඔවුන් වෙතින් ගිලිහී යන්නේයි.

---

**වීවේකයක් නොගෙන නොකඩවා වැඩ කිරීම සහ ආත්මික පෝෂණය ලබා නොගැනීම නිසා අප තුළ ප්‍රීතිය නැතිවී යාමද නොරිස්සුම් ස්වභාවය ඇති වීමද සමහර විට කලකිරීමද ඇතිවේ.**

---

අපට ශක්තිය ලැබෙන්නේ මෙම ප්‍රීතිය නිසාය (නෙහෙමියා 8:10) අප මුහුණ දෙන්නාවූ වාතාවරණය කොතරම් රළු වූවත් ජ්වලිතව දෙවිඳුන්ට සේවය කිරීම සඳහා අපට ප්‍රීතිය උපකාරී වේ. සමහර විට සිදුවූ විනාශය නිසා අපි වේදනාවෙන් හඬා වැලපෙමින් සිටින්නට පුළුවන. නමුත් අප හා ස්වාමින්වහන්සේගේ ප්‍රීතිය ගැඹුරින් තිබේ නම් මීට හේතුව වේදනාව මධ්‍යයේ වුවත් අපට ප්‍රේම කරන්නාවූ එමෙන්ම අප ගැඹුරින් ප්‍රේමය දක්වන්නාවූ එතුමාණන් සමග අලංකාර සහභාගීත්වයක් අප භුක්ති විඳීමයි. සහන සේවාවන් වල ඉතා ඛේදජනක තවත් පැත්තක් වන්නේ සහන

සේවකයන් විසින් ඇතිකර ගෙන ඇති ලිංගික සහ වෙනත් බොහෝ පාපයන්ය.සහන සේවකයන්ගේ ක්‍රියා කලාපය නිසා බොහෝ පවුල් විනාශ මුඛයට ඇද දමන්නට හේතු වී ඇත. බොහෝ සේවකයන් කායිකව හා මානසිකව පීඩාවට පත්ව (Burn Out) නැවත එවැනි වැඩ කරන්නට නොහැකි තත්ත්වයකට පත්ව ඇත. අසාධ්‍ය ලෙස රොගීව සිටින දරුවෙකු සිටින පවුලක දක්නට ලැබෙන්නේ මේ හා සමාන දෙයකි. තමන් විසින් උග්‍ර තත්ත්වයකට පත් කර ගෙන ඇති වාතාවරණය නිසා ස්වාමිපුරුෂයා භාර්‍යයාව දික්කසාද කිරීමට පවා නැඹුරු වේ. තමන්ගේ රෝගී දරුවාට උපස්ථාන කිරීමේ බැරෑරුම් කාර්යයේ මුළු ශක්තියෙන් ක්‍රියාකර ඇති නිසා තමන්ගේ විවාහ සම්බන්ධකම පෝෂණය කිරිම අතපසු කිරීම නිසා මෙය සිදුවේ. දරුවාගේ රෝගී කාලය පුරා දෙදෙනාම එකට වෙහෙස වූ නුමුත් දරුවා මිය ගිය විට ඔවුන් දෙදෙනා ඈත් වී සිටින අයුරු පැහැදිලි වන්නට පටන් ගනියි.

මේ නිසා හදිසි අවස්ථාවන් වලදී ඔබ "තමා පිළිබඳව කිට්ටු අවධානයකින් සිටිය යුතුය" (1 තිමෝති 4:16). අප පීඩාවට පත්ව සිටින කල නොසැලකිලිමත්කමින් ක්‍රියාකරන්න ඇති නැඹුරුතාවයක් වේ. ජීවිතය පාපයෙන් ආරක්‍ෂා කර ගන්නා පිණිස අප ගොඩනංවා තිබුණු ආරක්‍ෂක ක්‍රියා මාර්ගයන් දුර්වල වෙයි.

---

පාවුල් තුමා අනතුරු අඟවමින් දෙවිඳුන්ට අප්‍රසන්න ආකාරයෙන් ක්‍රියාකල හොත් අපගේ ක්‍රියාවන් නිරර්ථක ලෙස දෙවිඳුන් සළකන බවත් අවසාන විනිශ්චයේදී එය විනාශ වී ඇති ආකාරයට ගණන් ගන්නා බවත් සඳහන් කරයි.

---

මේ නිසා අප පුද්ගලිකව විධාවට පත්ව සිටින කල අපගේ පුද්ගලික ජීවිතය පිළිබඳව විශේෂ අවධානයකින් සිටිය යුතුව ඇත. අපගේ වෘත්තිමය හැසිරීම් රටාව පිළිබඳවත් අප සුපරීක්ෂාකාරී විය යුතුයි. පාවුල් තුමා අනතුරු අඟවමින් දෙවිඳුන්ට අප්‍රසන්න ආකාරයෙන් ක්‍රියා කළ හොත් අපගේ ක්‍රියාවන් නිරර්ථක වන ලෙස දෙවිඳුන් සළකන බවත් අවසාන විනිශ්චයේදී එය විනාශ වී ඇති ආකාරයට ගණන් ගන්නා බවත් සඳහන් කරයි (කොරින්ති 3:12-15). පහත සඳහන් වන්නේ අප පරීක්ෂාකාරී විය යුතු වෘත්තීමය දෝෂ කිහිපයකි.

- අප කරන්නාවූ කාර්යය පිළිබඳව අතිශෝක්තියෙන් ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටීමට වගබලා ගත යුතුය. නැතහොත් අපගේ වාර්තා කිරීම තුළින් අපට ගෞරවය ලබා ගැනීමෙන් වැළකී සිටිය යතුය. අප කරන්නාවූ දේ කරන්නාවූ කාර්යයන්හි ගෞරවය ලැබිය යුත්තේ දෙවිඳුන්ට පමණී (ගීතාවලිය 115:1; යෙසායා 48:11). අප වෙතට හා අපගේ සංවිධානයන් වෙත මූලික වශයෙන් ගෞරවය ලබා ගැනීමේ අධිෂ්ඨානයන් පිළිබඳව පූර්ණ අවධානයෙන් සිටිය යුතුය.
- එලෙසම අපට ලැබෙන්නාවූ මූල්‍යමය ආධාර පිළිබඳව සුපරීක්ෂාකාරී විය යුතුය. ඉතා හිදිසි වැඩ කටයුතු බොහෝමයක් තිබෙන නමුත් අප රටට පිළිගත් ගණකාධිකරණ මූලධර්ම උල්ලංඝනය නොකර ක්‍රියා කළ යුතුය. අවාසනාවකට මෙන් සහන මෙහෙයුම් වලදී බොහෝ මුදල්මය වංචාවන් සිදුවේ. මෙවැනි දූෂණ බොහෝමයක් ආරම්භ වූයේ යහපත් චේතනාවන් ඇතිව පටන් ගත් මූල්‍යමය ප්‍රතිපත්ති උල්ලංඝණය කිරීම හේතු කොට ගෙනය.

අවාසනාවකට මෙවන් සහන මෙහෙයම් වලදී බොහෝ මුදල්මය වංචාවන් සිදුවේ. මෙවන් දූෂන බොහෝමයක් ආරම්භ වූයේ යහපත් චේතනාවන් ඇතිව කල මූල්‍යමය ප්‍රතිපත්ති උල්ලංඝනය කිරීම හේතු කොටගෙනය.

- ව්‍යසනය හේතු කොට ගෙන සිදුවූ විනාශය නිසා අවශ්‍යතාවයන් සපුරා දෙන පිණිස විශාල ආධාර ප්‍රමාණයක් ලැබී ඇත. ලැබී ඇති මෙම ආධාර වලින් කොටසක් පුද්ගලිකව සුඛෝපභෝගී දෑ ලබා ගැනීමට වැය කිරිම සඳහා පරීක්ෂාවන් ඇති විය හැක. සමහර සහන සේවකයන්ගේ සුඛෝපභෝගී ජීවිත රටාව සිතා ගත නොහැකි තරම් නින්දිතය. කිතුණුවන් මෙම පරීක්ෂාවට ඉඩ නොදිය යුතුයි. ආත්ම ගරුත්වයෙන් යන අවංකභාවයෙන් ජීවත්වීම අප රටේ දුක් විඳින සමූහයා සමග සැබෑ අනන්‍යතාවයකට පැමිණිය හැකි එකම ආකාරය වන්නේය.

## සනසනු ලබන්නට කාලයක් සහ සැනසීමේ දෙවිඳුන් හට කාලයක්

පාවුල් දෙවිඳුන් හඳුන්වා දෙන්නේ "දයාබර කරුණාවන්ගේ පියවූද, සෑම සැනසිල්ලේ දෙවිවූද අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ" ලෙසය. "අපි දෙවියන්වහන්සේගෙන් යම් සැනසිල්ලක් ලැබවෙමුද ඒ සැනසිල්ල කරණකොට ගෙන කුමණ පීඩාවක් නමුත් විඳින්නන් සනසන්ට අපට පුලුවන් වන පිණිස උන්වහන්සේ අපේ සියලු පීඩාවලදී අප

සනසන සේක"
(2 කොරින්ති 1:3-4).

**අධික කම්පනයන් වලට මුහුණ දුන් අය දුකෙන් සහ තමන්ට සවන් දෙන්නට යමෙක් බලාපොරොත්තුවෙන් සිටින අයටද සුවය අත්දකින්ට හැකිවන පිණිස දෙවිඳුන්ගේ සැනසීම ලබා ඇති අයට කොතරම් මහත් විශාල උපකාරයක් කළහැකිද?**

අධික කම්පනයන් වලට මුහුණ දුන් අය දුකෙන් සහ තමන්ට සවන් දෙන්නට යමෙක් බලාපොරොත්තුවෙන් සිටින අයටද සුවය අත්දකින්ට හැකි වන පිණිස දෙවිඳුන්ගේ සැනසීම ලබා ඇති අයට කොතරම් මහත් විශාල උපකාරයක් කළ හැකිද? ඛේදවාචකයන්ට මුහුණ දිම නිසා මානසිකව සහ උද්වේගාත්මකව බලපෑමක් අත්වූ අයට උපස්ථානය කිරීමේ වැදගත්කම පැහැදිළිවී ඇති බව මා සිතමි. ව්‍යසනයන් ඇතිවූ ස්ථානවල් වලට වෘත්තීමය අනුශාසනයන් ක්ෂණිකව යොමු කරන ආකාරය අපට දක්නට ඇත. මෙහි අවශ්‍යතාවය පවතින අතර විශේෂඥයින්ගේ අදහස වන්නේ බලපෑම්වලට පසුව පුද්ගලයන් හඳුන්වන්නාවූ ගිහි පුද්ගලයන්ගේ මිත්‍රත්වයන් වැදගත් බවය. මෙවන් අයට වඩා ස්වාභාවික වාතාවරණයක් තුළ දීර්ඝ කාලයක් උපස්ථාන කරන්නට හැකියාවක් ලැබෙනු ඇත. මේ හැමට වඩා වැදගත් වන්නේ ඛේදවාචකය ඇති වෙන්නට පෙර සාමාන්‍යය යැයි සැළකූ ජීවිත වාතාවරණය හැකිතාක් ඉක්මණින් ගොඩ නැංවීමය. විශේෂඥයින්ට කළ හැකි ඉතාමත් වැදගත් කාර්යයක් වන්නේ ව්‍යසනයට හසුවූ අයගේ පවුල්, මිතුරන්, සගයන් සහ අසල්වැසියන් වෙතට නැවතත් සම්බන්ධ කිරිමය. ඊට හේතුව මෙවන් සම්බන්ධකම් තුළින් ජීවිතය

නැවත ශක්තිමත් වන නිසාය.

අධික කම්පනයට මුහුණ දුන් පුද්ගලයාට උපකාර කිරීම සඳහා අපට කළ හැකි සරලම කාර්යය වන්නේ ඔවුන් සමග සිටිමින් ඔවුන්ට සවන් දිමය. නමුත් ඔවුන් සාමා-න්‍යය ජීවිත රටාවකට ගෙන යෑමට ඇති අධික අවශ්‍යතාවය නිසා ඔවුන් සමග කථා කරන්ටත් අපට සිදුවනු ඇත. සවන් දීම පමණක් මේ අවස්ථාවේදී නොසෑහේ. විශේෂඥයින් පැහැදිළි කරන ආකාරයට සාමාන්‍ය අනුශාසනා කිරීමේ ක්‍රියාවලියේදී කරන්නාවූ සමහර දෑ අධික කම්පනයට මුහුණ දුන් අය සමග නොකළ යුතු බවය. උදාහරණයක් ලෙස අනුශාසක සේවයේ සාමාන්‍ය පිළිවෙතක් ලෙස වේදනාවට මුහුණ දුන් අයගේ වේදනාකා රී අත්දැකීම් පිළිබඳ කථා කරන්නට පෙළඹවීම සිදුවේ. නමුත් අධික කම්පන තත්ත්වයකදී අනුශාසනා කරන විට කම්පනයට හේතුවූ සිදුවීම සාකච්ඡා කරන්නට යොමු කළ යුත්තේ පුද්ගලයා එයට සුදානම් වූ අවස්ථාවේදී පමණි. එම විවෘත වීම සෑහෙන කල් ඉකුත්වූ පසු සිදුවන්නට පුලුවනි. කම්පනකාරි සිදුවීම ගැන කථා කිරිම පුද්ගලයාට දරන්නට බැරි තරම් හැඟීම් උත්තේජනය කරන්නට හැකියාවක් ඇත. අප මැතකදී මුහුණ දුන්නාවූ ඛේදවාචකය හා සම්බන්ධ සීමාන්තික ප්‍රතිචාරයන් ලෙස අධික භිය, කලකිරීම්, හුදකලාව සිටීම සහ නිහඬව සිටීම සහ තරහව, තීරණ ගැනීමට අපහසු වීම, තිගැස්සීම, භයානක සිහින සහ හැඬීම සාමාන්‍ය මනුෂ්‍ය ප්‍රතිචාරයන් ලෙස කිව හැක. බොහෝ අවස්ථාවන් වලදී ඉහත සලකුණු කාලයාගේ ඇවෑමෙන් පහව යන්නේය. අප මෙවැනි පුද්ගලයන් තේරුම් ගන්නට නම් ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ ඉක්මන් විනිශ්චයන් වලට එළඹීම නොකළ යුතුය. මේ ආකාරයෙන් උපස්ථාන කිරීමේ ආකෘතිය අපට ලැබෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගෙනි.

උන්වහන්සේ ස්වර්ගය අත්හැර අප අභියසට පැමිණ අපට වඩා අපව තේරුම් ගන්ට උන්වහන්සේට හැකිවිය. වෛද්‍ය වෘත්තිකයන් සමග පූර්ණකාලීන සේවයේ යෙදී සිටින මාගේ මිතුරෙකු වන අරුල් ඇන්කිටෙල් රුදුරු රළ පහරට පසු අනාථ කඳවුරක වයෝවෘද්ධ පුද්ගලයෙකු පිළිබඳව මෙසේ පැවසීය. ඔහුට අධික හෘදයාබාද රෝගී ලක්ෂණ තිබිණි. අරුල් තවත් වෛද්‍ය වරයකු සමග මෙම පුද්ගලයා පරීක්ෂා කිරීමෙන් පසුව හෘදයාබාධ තත්ත්වයෙන් නොපෙළෙන බව සනාථ විය. එම පුද්ගලයාගේ පවුලේ සාමාජිකයින් කිහිප දෙනෙක් ව්‍යසනයට හසුව මියගොස් තිබිණ. ඔවුන් ඔහු සමග කථා කර ඔහු වෙනුවෙන් යාච්ඤා කළ පසු හෘදයාබාධ ලක්ෂණ සියල්ල පහව ගොස් ඇති අයුරුද වෛද්‍යවරුන් යාච්ඤා කළ දෙවිඳුන් පිළිබඳ දැන ගැනීමේ පිපාසයක්ද ඇතිව තිබෙන බව දුටුවේය.

මෙම ව්‍යසනයෙන් පසුව ජලය ස්පර්ශ කිරීමට පවා බිය වන්නාවූ දරුවන් පිළිබඳ මා දැන ගතිමි. මා එක් පාසලකට ගිය විට ඉක්මනින් එය විවෘත කිරීමට කැමැත්තක් ඇති බව ගුරුවරයෙකු මා හට පැවසීය. නමුත් දෙමාපියන් තම දරුවන් පාසලට එවන්නට බියපත් වන්නේ එම පාසල මුහුදට ඉතා නුදුරුව පිහිටා ඇති හෙයිනි. දරුවන් පාසලේ ඉන්නාවූ කෙටි කාලයේ පවා තමුන්ගේ රැකවරණ-යෙන් ඈත්ව සිටීමට ඔවුන් අකමැති වූ නිසාය. මෙවැනි අවස්ථාවකදී උපස්ථානය කිරීම සඳහා තේරුම් ගැනීමේ ශක්තියත් නිපුණතාවයත් අත්‍යවශ්‍යය. සහන සේවකයෙකුට පුද්ගලීකව සැනසීම අවශ්‍යව ඇත. ව්‍යසන භූමිය තුළ ඔවුන් මුහුණ දී ඇති විවිධ විසඳුම් අධික උද්වේගාත්මක බලපෑමක් ඇති කර ඇත. මෙම ව්‍යසනයෙන් විනාශයට පත්වූ පාසලකට ගිය මුල් අවස්ථාවේදී මා දුටු දර්ශණ අධික ලෙස මා සිතට බලපෑ නිසා හඬන්නට

තරම් හැඟීමක් මා තුළ ඇති විය. තවත් සහෝදර සේවකයෙකු රුදුරු රළ පහර වැදීමට ටික වේලාවකට පසුව එම ප්‍රදේශයට ගිය විට ඔවුන්ගේ ඇස ගැටුනු මළ කඳන් හා අධික විනාශය දරන්නට නොහැකිව තනිවම හඬන්නට ඔහුගේ වෑන් රියට නැවත හැරී ගියේය. සිදුවූ විනාශය දැකීමෙන් පවා අපගේ මනසටත් හැඟීම්වලටත් අධික ලෙස බලපෑමක් ඇති විය හැක. මෙම වාතාවරණයේදී උපස්ථානය සඳහා යන සහන සේවකයන් පිළිබඳ අප කවුරුත් සංවේදී විය යුතුය. ඔවුන්ගේ වේදනාවන් අන් අය සමග බෙදා ගන්නටත් කිතුණු ප්‍රජාවේ සැනසීම ලබන්නටත්, දෙවිඳුන්ගේ සැනසීම ලබන්නටත් අවස්ථාවක් සළසා දිය යුතුමය.

තුවාල වූ මනුෂයයන් හට උපස්ථාන කරන්නා වූ කිතුණුවන් වීම සඳහා අල්ලා ගත හැකි උතුම් තම සත්‍යතාවයක් වන්නේ දෙවිඳුන් මනුෂ්‍යය ස්වභාවය ගත් පසු ඛේදවාචකයන් වලට මුහුණ දුන්නාවූ අය විඳින්නාවූ දුක සහ වේදනාව හා සමානව උන්වහන්සේද දුක් විඳින බවය. කුඩා දරුවෙක් කාලයේදී ප්‍රචණ්ඩකාරී මරනයකට ආසන්නයේදී දිවි ගළවා ගත්තේය. මේ නිසා ඔහුගේ පවුලේ අයට තම මව් රට අතහැර සරණාගතයන් ලෙස නොදන්නාවූ දේශයකට යාමට සිදුවිය.

විනාශය දැකීමෙන් පවා අපගේ මනසටත් හැඟීම්වලටත් අධික ලෙස බලපෑමක් ඇති විය හැක. මෙම වාතාවරණයේදී උපස්ථානය සඳහා යන සහන සේවකයන් පිළිබඳ අප කවුරුත් සංවේදී විය යුතුය.

ජනතාව ගළවා ගන්නා පිතිස පැමිණී උන්වහන්සේව ජනතාව විසින්ම ප්‍රතික්ෂේප කරනු ලැබීය.

සමහර විට ඔහු ඉතා තරුණ කාලයේදී ඔහුගේ පියා මිය ගියේය. අවම වශයෙන් සහෝදරයන් හතර දෙනෙක් සහ අප නොදන්නාවූ සහෝදරියන් සංඛ්‍යාවකින් යුත් පවුල් නඩත්තු කිරීමට සිදුවිය (මාර්ක් 6:3). ඔහු විධිමත් අධ්‍යාපනයක් නොලැබුවේය. උන්වහන්සේ නූගත් යැයි ආගමික බලධාරීන් සැළකුවේ මේ නිසාය (යොහාන් 7:15). බේදවාචකයන්ට මුහුණ දුන්නාවූ පවුල් වල දරුවන්ට මුහුණ දෙන්නට සිදුව ඇත්තේ මෙවැනි අවාසිදායක තත්ත්වයකි. මනුෂ්‍ය සංහතියේ සොයා ගෙන ඇති දරුණුතම මරණ දණ්ඩණය නියම වී අපරාධකරුවෙකු ලෙස ගණන් ගෙන අසාධාරණ ලෙස විනිශ්චය ලැබීමේ වේදනාව කෙලෙසදැයි උන්වහන්සේ දන්නා සේක. මා අවුරුදු 10 පමණ වයසේදී අධික ලජ්ජා සහගත සිදුවීමකට මුහුණ දුනිමි. කිසිවක් කර කියා ගන්නට බැරි තත්ත්වයේදී මාගේ මනසට ආ ප්‍රථම වචනය වූයේ "මාගේ දෙවියනි, මාගේ දෙවියනි! ඔබ මා අත්හැරියේ මන්ද?". මීට හුගක් කලකට පසු මට හැඟීගියේ මේ වචන මනසේ තිබුණේ මාංශවත් දෙවිඳුන් ප්‍රකාශ කළ වදන් නිසාය (මතෙව් 27:46). අප මුහුණ දෙන්නාවූ වේදනාව උන්වහන්සේ මුහුණ දුන් සේක. මනුෂ්‍ය සංහතිය මුහුණ දෙන්නාවූ වේදනාව හඳුනන්නාවූ දෙවිඳුන් නිසා අපට සැනසීම ඇත.

මනුෂ්‍යයන්ගේ ඇති විශාලතම අවශ්‍යතාවය වන්නේ "සියලු සැනසීමේ දෙවිඳුන්" සමග සම්බන්ධතාවයකට පැමිණීමය. සහන ක්‍රියාවලියේදී මෙන් අප කාර්‍යබහුලව සිටින නමුත් සියල්ලට වඩා මනුෂ්‍යයන්ට මනුෂ්‍යයන්ව ගැළවීම අවශ්‍ය වන බව අමතක නොකළ යුතුය. කෙසේ නමුත් අප සිහියේ තබා ගත යුතු කරුණක් නම් දෙවිඳුන්ගේ පණිවුඩය පිළිගන්නා පිණිස උන්වහන්සේ කිසි විටෙත බලහත්කරයෙන් උන්වහන්සේගේ පණිවුඩය පිළිගන්නා පිණිස

පොළඹවනු නොලබයි. එතුමන්ගේ ගැළවීමේ කාර්‍යය පිළිබඳව කරුණු පහදා දෙයි (යෙසායා 1:18). මේ නිසා අධාර ලැබීම නිසාවෙන් පමණක් ක්‍රිස්තුස්වහන්සේව පිළිගත යුතු වන්නේ යේසුස්-වහන්සේ තුළින් ඒ අයගේ ගැඹුරු අවශ්‍යතාවයන් දෙවියන්වහන්සේ සපුරාලන බවට ඔවුන්ගේ හදවතින් හා මනසින් පිළිගැනීමෙන්ය.

අපගේ කිතුණුකම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා සුවිශේෂ අවස්ථාවක් ව්‍යසන නිසා හේතුකොට ගෙන අපට ලැබේ. ව්‍යසනයක් සිදුවන කල කිතුණුවන් ඇසිය යුතු ප්‍රශ්නයක් වන්නේ

"දැන් මා කල්පනා කළ යුත්තේ කුමක්ද?" සහ "ක්‍රිස්තියානි අයුරින් මෙම අර්බුදයට මා ප්‍රතිචාරය දැක්විය යුත්තේ කෙලෙසද" යන්නය.